## කෑගල්ල ප්‍රාදේශීය සභාව.
## කෑගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කෑගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉඩම් හා ගොඩනැගිලි රු.160,354 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරි ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2015 හා 2017 වර්ෂ අතර කාලය තුල තැන්පත් කල නමුත් කල් ඉකුත් වී ඇති රු.174,576 ක් වූ කර්මාන්ත තැන්පත් 2 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අතරැදි මුදල් ගෙවා ඇතිද යන්න පරීක්ෂා කර නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 4 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාළ වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව කඩිනමින් සිදු කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (i) වගන්තිය | පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ඉදිරිපත් කිරීමෙන් තොරව කර්මාන්ත 04 ක් සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක් ලෙස රු. 478,831 ක අත්තිකාරම් ගෙවා තිබුණි. | බැඳුම්කරයක් ලබා ගැනීමෙන් පසුව කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් ගෙවිය යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 19,121,179 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 29,303,136 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම, රැස්කල ආදායම හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම, රැස්කල ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | (ප්‍රවර්ථන) රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළුහිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | (ප්‍රවර්ථන) රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 3,141,361 | 3,270,677 | 2,295,497 | 975,055 | 3,257,700 | 3,126,224 | 2,317,130 | 998,819 |
| ii | කුලී | 559,200 | 0.00 | 0.00 | 96,341 | 128,000 | 106,000 | 120,360 | 96,341 |
| iii | බලපත්‍ර ගාස්තු | 500,000 | 635,500 | 635,500 | 0.00 | 600,000 | 615,615 | 615,615 | 0.00 |
| iv | වෙනත් ආදායම් | 65,244,846 | 75,580,468 | 39,955,840 | 47,497,775 | 57,330,000 | 74,140,516 | 38,895,644 | 39,735,670 |

#### 2.2.2 වරිපනම් බදු

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසරකට වැඩි කාලයක සිට හිඟව පවතින වරිපනම් බදු හා අක්කර බදු රු.893,910 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ වගන්ති අනුව කටයුතු කර හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී එම හිඟ මුදල් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ කටයුතු කරන බවත්, අනෙක් වරිපනම් ඒකක සඳහා දේපල තහනම් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බවත් දන්වමි. |

**2.2.3 කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මොරොන්තොට වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු කරුවන්ගෙන් 2006 හා 2009 අතර කාලයට අදාල හිඟ කඩ කුලී රු. 95,989 ක් වීය. මේ සම්බන්ධයෙන් ගිවිසුමෙහි 1 වන වගන්තිය ප්‍රකාරව නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම ප්‍රකාරව හිඟ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අය කර ගත හැකි මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බවත්, අයකර ගත නොහැකි මුදල් කපා හැරීමට කටයුතු කරන බවත් දන්වමි. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 9,057,480 ක් හා මුද්දර ගාස්තු රු. 35,138,314 ක් විය. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගත යුතුය. | ලැබිය යුතු උසාවි දඩ මුදලින් 2020 වර්ෂය තුළ රු.3,220,895 ක මුදලක් ලැබී ඇති අතර, මුද්දර ගාස්තු මුදලින් 2020 වර්ෂය තුළ රු. 26,661,445 ක මුදලක් ලැබී ඇති බවත්, ඉතිරි හිඟ මුදල ගෙන්වා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සම්මත අතුරු ව්‍යවස්ථා 42 ක් පිළිගෙන තිබුණ අතර සතිපොල සඳහා පමණක් අතුරු ව්‍යවස්ථාවක් 2013 වර්ෂයේදී පනවාගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට ක්‍රියාකළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සභාවට අයත් දේපළ හඳුනා ගැනීම, අත්පත් කර ගැනීම හා ලේඛණගත කිරීමට සැලසුම් කර තිබුණද, ඔප්පු නොමැතිවීම හා ඔප්පුවල අඩුපාඩු පැවතීම හේතුවෙන් එම කටයුතු ඉටු කිරීමට නොහැකිවී තිබුණි. | සභාවට අයත් දේපල හඳුනාගෙන ලේඛණගත කිරීමට කටයුතු කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් සුසාන භූමිවලින් සමහර සුසාන භූමිවල පැවැත්ම තහවුරු කිරීම සඳහා ඔප්පු ලේඛනයේ පැවරීම් නියෝග ඇති අතර, ඉතිරි සුසාන භූමිවල අයිතිය තහවුරු කර ගැනීම සඳහා නීතිමය උපදෙස් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සුදුසු ඉඩමක් සොයා ගත නොහැකි වීම හේතුවෙන් අලෙවි අගයක් සහිත නොදිරන කසළ හැර අනෙකුත් කසළ එකතු කිරීමක් කර නොතිබුණි. දිරන කසළ ජීව කොටුවකට බැහැර කිරීම හා විවෘත ගිනි තැබීම මඟින් විනාශ කළ ද ඒ සඳහා ආදායම් උපයා ගත හැකි ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කළ යුතුය. | කුඩා නගර වල ව්‍යාපාරික ස්ථාන වල දිරන කසළ එකතු කිරීම සභාව විසින් සිදු කරනු ලබන අතර, එම කසළ දැනට කොම්පොස්ට් කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සැලසුම් කරමින් පවතී. ව්‍යාපාර ස්ථාන, නිවාස සහ බල ප්‍රදේශයේ පාසල් වලින් බැහැර වන දිරන කසළ එම ස්ථාන වලදීම කළමනාකරණය කර ගැනීමට අවස්ථාව සලසා ඇති අතර, ඒ පිළිබඳ නිරන්තර දැනුවත් කිරීමේ වැඩ සටහන් සභාව මඟින් සිදු කරනු ලබන බව දන්වමි. |

(ඈ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සභාව සතුව සුදුසු ඉඩමක් නොමැති බැවින් ඉඩමක් හෝ භූමියක් ඇති අයට පමණක් ගලි සේවාව සපයා තිබුණි. | ගලි අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් සපයා ගත යුතුය. | නාගරීකරණය අඩු ග්‍රාමීය ප්‍රදේශ පුරා ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය පැතිර ඇති බැවින් බොහොමයක් ජනතාවට තම ගෙවත්තේම අප ද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථානයක් සකස් කර ගැනීමට හැකියාව පවතින බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වසර 3ට අඩු කර්මාන්ත ණයගැතියන් රු. 478,645 ක් හා වසර 3 ට වැඩි රු. 658,773 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂයක කාලයක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු. 4,197,338 ක් වූ අතර ඒ තුල වසර 2 ත් 3 ත් අතර රු. 3,287,071 ක් හා වසර 4 ත් 5 අතර රු. 910,267 ක් වූ ණයහිමියෝ හා තැන්පතු විය. | පැරණි ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරිමට කටයුතු කල යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට තනතුරු වර්ග 05 කට අදාලව ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 07 ක් හා අතිරික්ත කාර්ය මණ්ඩලය 05 ක් විය. වැඩ පරිපාලක තනතුර 2019 ජුලි 30 දින සිට පුරප්පාඩුව පැවති අතර බර වාහන යන්ත්‍ර ක්‍රියාකරුවෙකුද බඳවා ගෙන නොතිබුණි. එසේම මුරකරු තනතුරද 2019 ජුනි 30 දින සිට පුරප්පාඩුව පැවති අතර ඒ සඳහා සේවා ගිවිසුම් පදනමින් සේවකයෙකු යොදවා ගෙන තිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. | වැඩ පරිපාලක තනතුර සඳහා නව බඳවා ගැනීමට අවස්ථාවක් නොමැති බැවින් එම තනතුරේ අධීක්ෂණය කටයුතු සඳහා ජ්‍යේෂ්ඨ සේවක මහතෙකු සේවයේ යොදවා ඇත. මුරකරු තනතුර සඳහා සේවා ගිවිසුම් පදනමින් සේවකයෙකු යොදවා ඇති බවත්, බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු තනතුරෙහි අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයෙන් අසමත් වී ඇති බව දන්වමි. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් නොලැබීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ අයවැය ලේඛණයට අනුව වාහන වලින් ආදායම් ලබා ගැනීමට අපේක්ෂාකර තිබුණද ජෙසීබී යන්ත්‍රය, ට්‍රැක්ටරය, මාර්ග තලනය හා විදුලි ජනක යන්ත්‍රවල අපේක්ෂිත ආදායමෙන් පිළිවෙලින් සියයට 1.5 හා 1.6 අතර ආදායමක් උපයා තිබුණි. | ඇස්තමේන්තුගත ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. | විදුලි ජනක යන්ත්‍රය අප්‍රේල් මාසයට පමණක් කුලියට ලබා ගැනීමත්, අනෙකුත් වාහනවල යම් යම් දෝෂ තිබීමත් හේතුවෙන් කුලියට ලබා දීමට නොහැකි තත්වයක් පැවතුණි. |

3.3.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) පොදු කටයුතු සඳහා 2012 වර්ෂයේ දී සභාවට ලැබී තිබුණු අක්කර 01 පර්චස් 26.2 ක ඉඩම් ප්‍රමාණයක් අනාරක්ෂිතව වල් බිහි වී තිබූ අතර ඉඩම වටා මායිම් කණු යොදා ඉඩම ආරක්ෂා කර ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගැනීමට අවධානය යොමු කර නොතිබුණි. | වත්කම් ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කළ යුතුය. | වැට ගැසීමට අදාල සභා වාර්තාව අනුමත කර ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අදාල යෝජනාව කාර්මික නිලධාරි වෙත ඉදිරිපත් කර ඇති බව දන්වමි. |
| (ආ) ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් සුසාන භූමි 14 ක් වටා වැටවල් යොදා සුරක්ෂිත කිරීමට පියවර ගෙන නොතිබූ අතර පැවැත්ම තහවුරු කිරීමට අදාල ලේඛණගත සාක්ෂි නොතිබුණි. | වත්කම් ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කළ යුතුය. | ඉදිරියේදී සුසාන භූමිවල වැට ගසා නාම පුවරු සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 309/4 වැය විෂයයේ ප්‍රතිපාදන ඉක්මවා රු. 63,288,258 ක වියදම් දරා තිබුණි. | ප්‍රතිපාදන අනුමත කර ගැනීමට ක්‍රියාකළ යුතුය. | මෙම වැය නිශ්චිතව ඇස්තමේන්තු කල නොහැකි බවත් මෙම දළ ඇස්තමේන්තුව හා සත්‍ය ලැබීම් වල විචලතාවයන් නිසා ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා ඇති බවත් දන්වමි. |
| (ආ) | ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා අයවැය මඟින් වෙන්කරන ලද රු. 16,500,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැළසුම්ගත ලෙස ප්‍රතිපාදන වෙන් කිරීමටත් එම ප්‍රතිපාදන ඵලදායිව උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුය. | ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීමේ දී සමහර වැය ශීර්ෂ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව දන්වමි. |

4.2 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 වගන්තිය ප්‍රකාරව, 2015 සිට 2019 වර්ෂය දක්වා කාලය තුල වැඩ තහනම් කළ සේවය අත්හිටුවීම හා සේවය අත් හැරයාම මත අයකර ගත යුතු රු. 221,704 ක් වූ සේවක ණය ශේෂ 05 ක් අයකර ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. | මෙම මුදල් පියවන ලෙස දන්වා ලිපි මගින් දැනුම් දුන්නද, මේ වන තෙක් ගෙවීමට කටයුතු කර නොමැති බැවින් නැවත දන්වා ඇපකරුවන් දැනුවත් කොට මුදල් අය කර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) කසල කළමණාකරන ව්‍යාපෘතිය සඳහා 2014 දී රු. 4,275,000 ක මුදලක් වැයකර මිලදී ගෙන තිබුණු අක්කර 10 ක ඉඩම එම ව්‍යාපෘතියට නුසුදුසු බව මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිර්දේශ කර තිබුණි. ඒ අනුව ඉඩම වෙනත් සුදුසු කාර්යයකට යොදා නොගැනීම හේතුවෙන් නිෂ්කාර්ය වත්කමක් බවට පත් වී තිබුණි. | වෙනත් කාර්යයක් සඳහා උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ)2011 සහ 2015 අතර කාලවලදී පළාත් පාලන අමාත්‍යාංශයෙන් සහ සබරගමුව පළාත් සභාවෙන් ලැබී තිබුණු රු. 41,864,734 ක් වටිනා වාහන 6 ක් හා රු. 4,281,000 ක් වටිනා ට්‍රැක්ටරයක් හා ටේලරයක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වාහන සභාවට පවරා ගැනීම සඳහා අවස්ථා ගණනාවක ඉල්ලුම් කර ලිපි ඉදිරිපත් කල අතර, අමාත්‍යාංශය වෙත ගොස්ද ඉල්ලීම් කරන ලදී. මේ වනවිට රටෙහි පවතින වාතාවරණය පහව ගොස් රාජ්‍ය ආයතන යථා තත්වයට පත්වූ වහාම අදාල පවරා ගැනීම් කටයුතු සිදු කරන බව දන්වමි. |
| (ඈ) 2013 වර්ෂයේ සිට ධාවන තත්ත්වයේ නොපවතින රු. 625,000 ක් වටිනා ඩබල් කැබ් රථය, හා රු.346,878 ක් වටිනා ට්‍රැක්ටරය අලුත්වැඩියා කර පාවිච්චියට ගැනිමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | ඩබල් කැබ් රථය අපහරණය කිරීම සඳහා අවශ්‍ය ලියවිලි කිසිත් නොමැති බැවින් ලියවිලි සකස් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරන බවත්, ට්‍රැක්ටර් අපහරණය කිරීම සඳහා අදාල චක්‍ර ලේඛය අනුව අදාල කමිටු පත්කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමා වෙත ඉදිරිපත් කර ඇති බවත් දන්වමි. |